# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2044/36 - 2017 නොවැම්බර් මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 1002 දරන සුරාබදු නිවේදනය

**එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය මත සුරාබදු අනුපාත**

සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 22 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මා විසින්, මෙම නියමය මගින්, මෙහි දැක්වෙන උපලේඛනයේ II තීරුවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන බද්ද, I වන තීරුවේ ඊට අනුරූපී සටහන්හි නිශ්චිතව සඳහන් කරනු ලබන අමුද්‍රව්‍ය මත 2017 නොවැම්බර් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| I වන තීරුව | | II වන තීරුව |
|---|---|---|
| සුරා බද්දට යටත් භාණ්ඩ | | ගෙවිය යුතු බද්ද<br>රු. ශත |
| (i) | පොල් රා (තොග ලීටරයක් සඳහා) | 05.00 |
| (ii) | මොලෑෂස් (තොග කිලෝ ග්‍රෑමයක් සඳහා) | 10.00 |
| (iii) | ආසවනය මගින් ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන සහල් පල්ප (තොග කිලෝ ග්‍රෑමයක් සඳහා) | 10.00 |
| (iv) | ආසවනය මගින් ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන ඉරිඟු පල්ප (තොග කිලෝ ග්‍රෑමයක් සඳහා) | 10.00 |
| (v) | ආසවනය මගින් ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා යොදාගන්නා පළතුරු පල්ප (තොග කිලෝ ග්‍රෑමයක් සඳහා) | 10.00 |


1A - PG 3749 — 557 (2017/11)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*නියම හා කොන්දේසි*

වෙනත් යම් නිවේදනයක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මෙම නියෝගය යටතේ පනවනු ලබන බද්ද -

(අ) යම් මාසයක පළමු දින පහළොව තුළ ආසවනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය තොගයට අදාළව එම මාසයේ අවසාන දිනට පෙර ගෙවිය යුතු ය ; සහ

(ආ) එම මාසයේ පළමු දින පහළොවට පසු කාල සීමාව තුළ දී ආසවනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය තොගයට අදාළව ඊළඟ මාසයේ පහළොස්වන දිනයට පෙර ගෙවිය යුතු ය.

එසේ වුව ද, උපලේඛනයේ II වන තීරුව යටතේ පනවන ලද බද්ද මෙහි නියම කරන ලද කාල සීමාව තුළ දී ගෙවනු නොලබන්නේ නම්, එම බද්ද ගෙවීමට අමතරව මසකට සියයට තුනක් (3%) බැගින් වූ අනුප්‍රමාණයක අධිභාරයකට යටත්වනු ලැබිය යුතු ය.

11 - 1107

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.